චක්‍රලේඛ අංක - 03/2019

මගේ අංකය : MOJ/E15/පොදු කටයුතු
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිංස්කරණ අමාත්‍යාංශය
කොළඹ 12
2019.06. 10

සියළුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් / දිසා විනිසුරුවන්
මහේස්ත්‍රාත්වරුන් වෙත.

<u>හදිසි මරණ පරීක්ෂකවරුන්ට කරනු ලබන ගෙවීම් සංශෝධනය කිරිම.</u>

හදිසි මරණ පරීක්ෂකවරුන්ට හදිසි මරණ පරීක්ෂණයක් පැවැත්වීම වෙනුවෙන් ගාස්තු ඒ සඳහා ගමන් වියදම් සහ යැපීම් දීමනා ගෙවීම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ X වන පරිච්ඡේදයේ 3 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කෙරේ.

02. අමප 19/0335/126/012 හා 2019.03.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, හදිසි මරණ පරීක්ෂකවරුන් සඳහා සඳහා ගෙවනු ලබන දීමනා පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

03. ඒ අනුව, මෙම අමාත්‍යාංශය විසින් හදිසි මරණ පරීක්ෂක ගාස්තු හා සංයුක්ත දීමනා ගෙවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක 4/98 හා 1998/05/19 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3.1 හා 3.5 වගන්තින්හි සඳහන් විධිවිධාන පහත පරිදි සංශෝධනය කෙරේ.

3.1 වගන්තිය : හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් ගාස්තු රු1000.00 (මෙම ගාස්තුවට තැපල් ගාස්තු හා ලිපිද්‍රව්‍ය වියදම් ඇතුලත් වේ)

3.5 වගන්තිය : ආණ්ඩුවේ වෛතනික නිලධාරීන් නොවන හදිසි මරණ පරීක්ෂණයන්ට ඉන්ක්වැස්ට් විභාගයක් සඳහා ගෙදරින් පිටව් සිටීම අවශ්‍ය වන කාල පරිච්ඡේදය වෙනුවෙන් පහත සඳහන් ගාස්තු ප්‍රමාණය අනුව යැපීම් දීමනාව ගෙවනු ලැබේ.

| | |
|---|---|
| එක් සම්පූර්ණ පැය 24 ක කාලයකට | රු.1000.00 |
| පැය 12 කට නොඅඩු කාලයකට | රු. 750.00 |
| පැය 6 කට නොඅඩු කාලයකට | රු. 500.00 |

04. හදිසි මරණ පරීක්ෂකවරුන්ට මරණ පරීක්ෂණයක් සඳහා ගෙවන ගාස්තු හා සංයුක්ත දීමනා ගෙවීම් සම්බන්ධව මවිසින් මීට පෙර නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධාන මෙයින් අවලංගු කෙරේ.

05. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2019.03.20 දින සිට ක්‍රියාත්මක වේ .

ආර්.එම්.ඩී.බී.මීගස්මුල්ල
ලේකම්
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත් :

01. ලේකම්,මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය - දැ.ගැ.ස
02. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - අ.කා.ස
03. විගණකාධිපති - දැ.ගැ.ස
04. ලේකම්,සමස්ථ ලංකා හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ සංගමය - දැ.ගැ.ස
05. ප්‍රධාන මුල්‍ය නිලධාරී,අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය - අ.කා.ස/දැ.ගැ.ස
06. ප්‍රධාන ගණකාධිකාරී , අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය - දැ.ගැ.ස